12774

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை National Evaluation and Testing Service ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Department of Examinations
National Evaluation and Testing Service

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන
විවෘත තරඟ විභාගය - 2011 (2012)

පැය දෙකයි

# (03) සාමාන්‍ය දැනුම

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**



* **පැන්සලෙන් ලකුණු කරන ලද හා මකන දියර භාවිත කරන ලද උත්තර ඇගයීමට ලක් නොකෙරේ.**
* ***I* කොටසට පිළිතුරු සැපයීමේ දී පහත දක්වා ඇති ආකාරයට වඩා වෙනස් ආකාරයට ලියන ලද ඉලක්කම් සහිත උත්තර ඇගයීමට ලක් නොකෙරේ.**

**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන සහ පස්වන පිටුවල ද ඇති තිත් ඉරි මත ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.....................................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වන අතර පිටු **10** කින් යුක්ත වේ.
* ***I*** වන කොටස බහුවරණ ප්‍රශ්න **50** කින් ද ***II*** වන කොටස කෙටි පිළිතුරු සපයන ප්‍රශ්න **50** කින් ද සමන්විත ය.
* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය දෙකකි.**
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත්‍රය ශාලාධිපතිට භාර දිය යුතු ය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල් හෝ කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
* **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| | පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|---|
| I | 2 | 1 - 12 | |
| | 3 | 13 - 21 | |
| | 4 | 22 - 32 | |
| | 5 | 33 - 42 | |
| | 6 | 43 - 50 | |
| II | 7 | 51 - 63 | |
| | 8 | 64 - 76 | |
| | 9 | 77 - 89 | |
| | 10 | 90 - 100 | |
| | | එකතුව | |

| | | |
|---|---|---|
| මුළු එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

- අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතුරින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා, එහි **අංකය**, ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

1. 2010 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව මෙම වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම් ඉලක්කය ඇමරිකා එක්සත් ජනපද ඩොලර්
   (1) 2900 කි. (2) 3000 කි. (3) 3100 කි. (4) 3200 කි. (.........)

2. වර්තමාන ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය
   (1) 7.4% කි. (2) 6.3% කි. (3) 5.2% කි. (4) 4.2% කි. (.........)

3. අනෙකුත් සාක් රටවල් සමග සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව ලබා ඇති **සුවිශේෂ** තත්ත්වය නම්
   (1) නුගත්කම අවම වීමයි. (2) යටිතල පහසුකම් වර්ධනය වීමයි.
   (3) දේශපාලන ස්ථාවරභාවය ලබා තිබීමයි. (4) ජනතාවගේ කුසලතා වැඩි වීමයි. (.........)

4. දිවයිනේ සෑම නිවෙසකට ම විදුලි බලය ලබාදීමට සැලසුම් කොට ඇති වර්ෂය
   (1) 2013 වේ. (2) 2014 වේ. (3) 2015 වේ. (4) 2016 වේ. (.........)

5. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?
   (1) ජනගහනය මිලියන 21.1 ක් පමණ වේ.
   (2) වයස අවුරුදු 65 ට වැඩි ජනගහනය 10.5% ක් පමණ වේ.
   (3) ආයු අපේක්ෂණය අවුරුදු 75 ක් පමණ වේ.
   (4) මාතෘ මරණ අනුපාතය ලක්ෂයකට 39 ක් වේ. (.........)

6. අල්ලස් හා දූෂණ පිළිබඳ දැනුම් දියයුතු ශ්‍රී ලංකා ටෙලිකොම් සෘජු දුරකථන අංකය මින් කුමක් ද?
   (1) 1924 (2) 1954 (3) 1964 (4) 1984 (.........)

7. ශ්‍රී ලංකා ජාතික ධජය එසවීමේ දී අනුගමනය **නොකළ** යුත්තක් වන්නේ එය
   (1) වෙනත් ධජ එසවීමට පෙර එසවීම ය.
   (2) සියලු රාජ්‍ය උත්සවවල දී එසවීම ය.
   (3) ආගමික ධජවලට පහළින් එසවීම ය.
   (4) උත්සවාකාරයෙන් සෙමින් අහසට එසවීම ය. (.........)

8. දේශගුණික අර්බුදය පිළිබඳ ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති ඉතා වැදගත් පියවර කුමක් ද?
   (1) හරිත ලංකා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
   (2) පරිසර සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
   (3) ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම
   (4) දේශගුණික වෙනස්වීම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම (.........)

9. ශ්‍රී ලංකාවේ **ප්‍රථමවරට** කිතුල් ගොවිපොළක් ආරම්භ කරනු ලබන්නේ
   (1) මාතර ය. (2) කළුතර ය. (3) බෙන්තර ය. (4) මුතුරාජවෙල ය. (.........)

10. **ප්‍රථමවරට** ශ්‍රී ලංකාවෙන් බඩ ඉරිඟු ටොන් 10 000 ක් අපනයනය කරනු ලැබුවේ
    (1) තායිවානයට හා කැනඩාවට ය. (2) චීනයට හා පිලිපීනයට ය.
    (3) මාලදිවයිනට හා ඕමානයට ය. (4) නේපාලයට හා පකිස්ථානයට ය. (.........)

11. වත්මන්හි ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රදේශය (forest area) රටේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට කීයද?
    (1) 21% (2) 24% (3) 27% (4) 29% (.........)

12. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත දියුණු කිරීම සඳහා ඉදිරිපත් වී ඇති රට
    (1) ඉන්දියාව ය. (2) චීනය ය.
    (3) දකුණු කොරියාව ය. (4) ජපානය ය. (.........)

12774



විභාග අංකය :.......................

13. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?
   (1) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සියයට සියයක් ම පෞද්ගලික අංශයට අයත් වේ.
   (2) සංචාරක ප්‍රතිපත්තිය සකස් කිරීම රජයේ කාර්යයක් වේ.
   (3) මෙම වර්ෂය තුළ ශ්‍රී ලංකාවට පැමිණෙතැයි අපේක්ෂිත සංචාරකයින්ගේ සංඛ්‍යාව 950 000 ක් පමණ වේ.
   (4) දැනට වැඩි ම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණෙන්නේ මැදපෙරදිග රටවලිනි. (.........)

14. ජාතික අධ්‍යාපන කොමිසම මගින් වර්ෂ 1992 දී ඉදිරිපත් කරන ලද ජාතික පොදු අරමුණුවලින් ප්‍රථම අරමුණ වන්නේ "ක්‍රියාශීලි ජාතික ඒකාබද්ධතාවත්, ජාතික අනන්‍යතාවත් හා ජාතික සමගියත් ගොඩනැගීමයි." මේ සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රියාමාර්ගය වන්නේ
   (1) අන්‍යෝන්‍ය ඉතිහාසය පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීමයි.
   (2) බහුසංස්කෘතික අධ්‍යාපනයක් ලබාදීමයි.
   (3) සහජීවනය පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීමයි.
   (4) සිරිත් විරිත් පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීමයි. (.........)

15. වර්ෂ 2016 වන විට ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය 75% දක්වා වැඩිදියුණු කිරීම රජයේ අපේක්ෂාවයි. වර්තමානයේ මෙරට පරිගණක සාක්ෂරතාවය
   (1) 25% ක් පමණ වේ. (2) 30% ක් පමණ වේ.
   (3) 35% ක් පමණ වේ. (4) 40% ක් පමණ වේ. (.........)

16. ශ්‍රී ලංකාවේ පිහිටි **ලෝක උරුම ස්ථාන වැඩිම** සංඛ්‍යාවක් සඳහන් වන්නේ මින් කුමන පේළියේ ද?
   (1) අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල, ගාල්ල, මහනුවර, සීගිරිය
   (2) අනුරාධපුරය, පොළොන්නරුව, දඹුල්ල, මහනුවර, තිස්සමහාරාමය, සීගිරිය
   (3) අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, ගාල්ල, සිතුල්පව්ව
   (4) අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, මහනුවර, අලුවිහාරේ (.........)

17. ශ්‍රී ලංකාවේ **ප්‍රථම** කම්කරු මැයි දිනය පවත්වන ලද්දේ වර්ෂ
   (1) 1933 දී ය. (2) 1948 දී ය. (3) 1956 දී ය. (4) 1978 දී ය. (.........)

18. මින් **නොගැළපෙන** යුගලය කුමක් ද?
   (1) ඊ. ඩබ්ලිව්. පෙරේරා - නාට්‍ය
   (2) පීටර් පිල්ලේ පියතුමා - අධ්‍යාපනය
   (3) පෙරී සුන්දරම් - කම්කරු ව්‍යාපාරය
   (4) ජෙෆ්රි බාවා - ගෘහ නිර්මාණ ශිල්පය (.........)

19. ශ්‍රී ලංකා රුපියල් **අඩුම** ප්‍රමාණයක් ලැබෙන්නේ පහත සඳහන් මැදපෙරදිග කුමන මුදල් ඒකකයක් හා හුවමාරු කිරීමේ දී ද?
   (1) කුවේට් ඩිනාර් (2) බහරේන් ඩිනාර්
   (3) කටාර් රියාල් (4) ඕමාන් රියාල් (.........)

20. ආර්ථික වගාවක් වශයෙන් සෝයා බෝංචි අක්කර 25 000 ක් වගා කිරීම ආරම්භ කොට ඇත්තේ කුමන පළාතේ ද?
   (1) වයඹ පළාත (2) උතුරු මැද පළාත (3) ඌව පළාත (4) දකුණු පළාත (.........)

21. ශ්‍රී ලංකාව 'සෙරෙන්ඩිබ්' නමින් හැඳින්වූයේ
   (1) ග්‍රීකයන් විසිනි. (2) රෝමවරුන් විසිනි.
   (3) අරාබින් විසිනි. (4) පෘතුගීසීන් විසිනි. (.........)

22. වර්තමාන ඉන්දියාවේ දේශපාලන දර්ශනය, ඉන්දියානු අනන්‍යතාවය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ හැඩගැස්ම සකස් කිරීම සඳහා **වැඩියෙන් ම** ඉවහල් වූ නායකයින් සඳහන් වන්නේ මින් කුමන පෙළියේ ද?
    (1) මහත්මා ගාන්ධිතුමා, ජවහර්ලාල් නේරු, රවීන්ද්‍රනාත් තාගෝර්, බී. ආර්. අම්බෙඩ්කාර්
    (2) මහත්මා ගාන්ධිතුමා, ජවහර්ලාල් නේරු, ජයප්‍රකාශ් නාරායන්, රාජේන්ද්‍ර ප්‍රසාද්
    (3) මහත්මා ගාන්ධිතුමා, ජවහර්ලාල් නේරු, රවීන්ද්‍රනාත් තාගෝර්, විනෝභා භාවේ
    (4) මහත්මා ගාන්ධිතුමා, ජවහර්ලාල් නේරු, රවීන්ද්‍රනාත් තාගෝර්, හුමායුන් කබීර් (.........)

23. මෑත කාලයේ දී දේශපාලන වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇති තහිර් චතුරශ්‍රය (Tahir Square) පිහිටියේ
    (1) ඊජිප්තුවේ ය. (2) චීනයේ ය.
    (3) දකුණු කොරියාවේ ය. (4) ජපානයේ ය. (.........)

24. ඉන්දියාවේ 'තොරතුරු සංනිවේදන තාක්ෂණික නුවර' කුමක් ද?
    (1) නවදිල්ලිය (2) බැංගලෝරය (3) මුම්බායි (4) චෙන්නායි (.........)

25. ඉතා මෑතක දී න්‍යෂ්ටික බලයෙන් යුත් සබ්මැරීනයක් හිමිකර ගත් රට කුමක් ද?
    (1) ප්‍රංශය (2) රුසියාව (3) චීනය (4) ඉන්දියාව (.........)

26. අප්‍රිකාවේ සමහර රටවල් සංවර්ධනය සඳහා ආසියාවේ ආර්ථික බලවතුන්ගේ ආධාර ලබා ගනිමින් සිටී. එම රටවලට **වැඩියෙන් ම** ණය ආධාර ලබා දී ඇති රට කුමක් ද?
    (1) ඉන්දියාව (2) චීනය (3) සිංගප්පූරුව (4) මලයාසියාව (.........)

27. ලෝකයේ ජන සංඛ්‍යාව **වැඩි ම** නුවර මින් කුමක් ද?
    (1) ටෝකියෝ (2) නිව්යෝර්ක් (3) ජිනීවා (4) ලන්ඩන් (.........)

28. **සම්මත** (standard) චීන භාෂාව හඳුන්වන නම කුමක් ද?
    (1) පෂ්ටෝ (Pashto) (2) සොන්කා (Dzongkha)
    (3) ස්වාහිලි (4) මැන්ඩරින් (.........)

29. ආදිවාසි නායකයකු ජනාධිපති වශයෙන් තෝරාගනු ලැබ ඇති රට කුමක් ද?
    (1) චිලි (2) පේරු (3) පැරගුවේ (4) බොලිවියාව (.........)

30. පහත සඳහන් වන්නේ ලෝක ඉතිහාසයේ හටගත් ඉතා වැදගත් විප්ලව හතරකට අදාළ වර්ෂ හතරකි. ඉන් කියුබානු විප්ලවය හටගත්තේ කුමන වර්ෂයේ දී ද?
    (1) 1789 (2) 1917 (3) 1949 (4) 1959 (.........)

31. ලෝකයේ සාගර, ඒවායේ විශාලත්වය අනුව **නිවැරදි අනුපිළිවෙළින්** සඳහන්ව ඇත්තේ කුමන පෙළියේ ද?
    (1) පැසිෆික් සාගරය, අත්ලන්තික් සාගරය, ඉන්දියන් සාගරය, ආර්ක්ටික් සාගරය
    (2) අත්ලන්තික් සාගරය, පැසිෆික් සාගරය, ඉන්දියන් සාගරය, ආර්ක්ටික් සාගරය
    (3) ඉන්දියන් සාගරය, පැසිෆික් සාගරය, අත්ලන්තික් සාගරය, ආර්ක්ටික් සාගරය
    (4) ආර්ක්ටික් සාගරය, පැසිෆික් සාගරය, අත්ලන්තික් සාගරය, ඉන්දියන් සාගරය (.........)

32. BIMSTEC රටවල් **සියල්ල** සඳහන් වන්නේ මින් කුමන පෙළියේ ද?
    (1) නේපාලය, ඉන්දියාව, භූතානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, සිංගප්පූරුව, මලයාසියාව
    (2) නේපාලය, ඉන්දියාව, භූතානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, මියන්මාර්, කාම්බෝජය
    (3) නේපාලය, ඉන්දියාව, භූතානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, සිංගප්පූරුව, පිලිපීනය
    (4) නේපාලය, ඉන්දියාව, භූතානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, මියන්මාර්, තායිලන්තය (.........)

EXAMMOOD.LK
EXAMMOOD.LK

33. මින් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
   (1) වත්මන්හි ලොව පුද්ගලයින් පස් දෙනකුගෙන් එක් අයකු එනම් බිලියන 1.4 ක් දෙනා ජීවත්වන්නේ දිනකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1.25 කට අඩු ආදායමකිනි.
   (2) ලොව සෑම දිනකම බිලියනයක් පමණ දෙනා රාත්‍රි නින්දට යන්නේ කුසගින්නෙනි.
   (3) දේශගුණික වෙනස්වීම් අවම කර නොගතහොත් ලොව සත්ත්ව විශේෂ හා ශාක විශේෂ රාශියක් විනාශයට පත් වේ.
   (4) වර්ෂ 2015 වන විට ලෝක ජනගහනය බිලියන 8 කට ආසන්න වනු ඇත. (.........)

34. මුහුදු මට්ටමෙන් උසින් ම පිහිටි නුවර මින් කුමක් ද?
   (1) තිම්පු (2) ලාසා (3) කත්මණ්ඩු (4) සිම්ලා (.........)

35. ඇතැම් සමාජ විද්‍යාඥයින්ට අනුව වත්මන්හි ශිෂ්ටාචාර අතර ඝට්ටනයක් (Clash of Civilizations) හටගෙන ඇතැයි සලකනු ලැබේ. එම ඝට්ටනය ඇත්තේ
   (1) ඇමරිකානු හා ඉස්ලාමීය ශිෂ්ටාචාරය අතර ය.
   (2) ඇමරිකානු හා චීන ශිෂ්ටාචාරය අතර ය.
   (3) යුරෝපීය හා ඉන්දියානු ශිෂ්ටාචාරය අතර ය.
   (4) යුරෝපීය හා අප්‍රිකානු ශිෂ්ටාචාරය අතර ය. (.........)

36. නොබැඳි ව්‍යාපාරය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
   (1) එහි පළමු සමුළුව පැවැත්වූයේ වර්ෂ 1961 දී බෙල්ග්‍රේඩ් නුවර දී ය.
   (2) එහි වත්මන් සාමාජික සංඛ්‍යාව 120 ක් වේ.
   (3) එහි අරමුණ මැදි පිළිවෙතක් අනුගමනය කිරීම වේ.
   (4) එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රතිපත්තිවලට සහයෝගය දක්වයි. (.........)

37. අකිරා කුරොසාවා (Akira kurosawa) යනු ජපානයේ විසූ ශ්‍රේෂ්ඨ
   (1) ඉතිහාසඥයෙකි. (2) සමාජ විද්‍යාඥයෙකි.
   (3) චිත්‍රපට නිෂ්පාදකයෙකි. (4) සමාජ සේවකයෙකි. (.........)

38. ඉතා අසාධ්‍ය රෝගියකු ස්වේච්ඡාවෙන් වෛද්‍යවරයකුගේ ආධාරයෙන් ජීවිතය කෙළවර කර ගැනීම (euthanasia) නීතිගත කොට ඇති රට කුමක් ද?
   (1) බෙල්ජියම (2) නෝර්වේ (3) ඩෙන්මාර්කය (4) ස්වීඩනය (.........)

39. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (Convention on the Rights of the Child) අනුමත වූ වර්ෂය කුමක් ද?
   (1) 1959 (2) 1969 (3) 1989 (4) 1999 (.........)

40. 2011 සැප්තැම්බර් මාසයේ සිට කාන්තාවන්ට ප්‍රථම වතාවට ඡන්ද බලය ලබා දුන් රට කුමක් ද?
   (1) සවුදි අරාබිය (2) ඉරානය (3) ඉරාකය (4) කටාර් (.........)

41. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබූ 193 වැනි රට කුමක් ද?
   (1) උතුරු සුඩානය (2) දකුණු සුඩානය
   (3) නැගෙනහිර ටිමෝරය (4) කිරිබති (.........)

42. වර්ෂ 1990 දී UNDP ආයතනය විසින් ඉදිරිපත් කරන ලද, වත්මන්හි ඉතා ජනප්‍රියව ඇති මානව සංවර්ධන දර්ශකයේ සංරචකයක් (component) **නොවන්නේ** කුමක් ද?
   (1) ආයු අපේක්ෂණය (2) අධ්‍යාපනය
   (3) දළ ජාතික ආදායම (4) යහපාලනය (.........)



EXAMMOOD.LK

43. ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (International Literacy Day) පවත්වන්නේ

(1) ජූනි 5 වැනිදා ය.  (2) ජූලි 11 වැනිදා ය.
(3) සැප්තැම්බර් 8 වැනිදා ය.  (4) ඔක්තෝම්බර් 24 වැනිදා ය.  (.........)

44. පහත සඳහන් වැකි අතුරින් **මතයක්** ප්‍රකාශ වන්නේ කුමන වැකියෙන් ද?

(1) රාජ්‍යය නමැති ආයතනය සැමවිටම සදාචාර විය යුතුයි.
(2) විද්‍යාව දියුණු වුව ද ඉන් ජීවිත අරමුණු ප්‍රකාශ නොකෙරෙයි.
(3) ලෝකයේ එකම ස්ථිර දේ, වෙනස්වීම් ස්වභාවයයි.
(4) සංවර්ධනයට පෞද්ගලික අංශයේ සහයෝගය අවශ්‍ය වෙයි.  (.........)

45. වර්තමාන මනුෂ්‍ය වර්ගයා මුහුණපාන **ප්‍රධාන** ගැටලුව නම්

(1) ප්‍රතිජනනය කළ නොහැකි සම්පත් වියැකී යාම ය.
(2) න්‍යෂ්ටික අවි නිෂ්පාදනය ව්‍යාප්ත වෙමින් තිබීම ය.
(3) කාර්මිකකරණය නිසා ලෝකය උණුසුම් වීම ය.
(4) ලෝක ග්‍රාමය තුළ මිනිසා ගෝත්‍රිකභාවයෙන් නොමිදීම ය.  (.........)

46. ලෝක ඉතිහාසය වෙනස් කිරීමට හේතු වූ ප්‍රධාන නවෝත්පාදන කිහිපයක් ම චීනය සතු ය. මින් චීනයට අයත් **නොවන** නවෝත්පාදනය කුමක් ද?

(1) කඩදාසි  (2) වෙඩි බෙහෙත්
(3) මාලිමා යන්ත්‍රය (Magnetic compass)  (4) වැද්ධි දර්ශකය (Magnifying glass)  (.........)

47. පෘථිවිය වටා භ්‍රමණය වීම සඳහා චන්ද්‍රයා ගත කරන දින ගණන

(1) $26\frac{1}{2}$ කි.  (2) $27\frac{1}{2}$ කි.  (3) $28\frac{1}{2}$ කි.  (4) $29\frac{1}{2}$ කි.  (.........)

48. වත්මන්හි සකස් කරන ලද සමහර ආහාර වර්ග සඳහා භාවිත කරනු ලබන සංයෝග කාරක (additives) මිනිසාගේ සෞඛ්‍යයට අහිතකර වේ. ඇතැම් විටෙක මෙසේ ආහාරවලට එකතු කරනු ලබන කහ පැහැති ඩයි වර්ගය කුමක් ද?

(1) සෝඩියම් නයිට්‍රයිට් (Sodium nitrite)  (2) ටාට්‍රසීන් (Tartrazine)
(3) ඔලෙස්ට්‍රා (Olestra)  (4) සැකරින් (Saccharin)  (.........)

49. කිරිවල පිරිසිදු බව මනිනු ලබන මාපකය මින් කුමක් ද?

(1) ලැක්ටොමීටරය (Lactometer)  (2) ඇමීටරය (Ammeter)
(3) සැකරොමීටරය (Saccharometer)  (4) මැනෝමීටරය (Manometer)  (.........)

50. රෝම ඉලක්කමෙන් 1984 සඳහන් වන්නේ මින් කුමන පේළියේ ද?

(1) MCDIV
(2) MDCIV
(3) MCMLXXXIV
(4) MMIV  (.........)

## II කොටස

- අංක **51** සිට **100** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුර, දී ඇති **තිත් ඉර මත** ලියන්න.

51. ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය වන දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගයේ වැඩ නිම කළ විට එහි සම්පූර්ණ දිග කිලෝමීටර කීයද?

......................................................................................................................................................

52. පසුගියදා ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දියානු ලෝක් සභාවේ විරුද්ධ පක්ෂයේ නායිකා සුෂ්මා ස්වරාජ් මැතිනිය අයත් දේශපාලන පක්ෂය කුමක් ද?

......................................................................................................................................................

53. මාලදිවයිනේ ජාතික ගීය වන ගව්මී සලාම් (Gaumee Salaam) ගීතයට සංගීතය සැපයූ ශ්‍රී ලාංකිකයා කවුද?

......................................................................................................................................................

54. ශ්‍රී ලංකාවේ 'යුනෙස්කෝ ජාතික කොමිසම' පිහිටුවා ඇත්තේ කුමන අමාත්‍යාංශය යටතේ ද?

......................................................................................................................................................

55. වර්තමාන ශ්‍රී ලාංකික කාන්තාවකගේ ආයු අපේක්ෂණය වර්ෂ කීය ද?

......................................................................................................................................................

56. 'බිම්සවිය' යනු කුමක් ද?

......................................................................................................................................................

57. අච්චුවේලි කර්මාන්තපුරය සඳහා ආධාර දෙන රට කුමක් ද?

......................................................................................................................................................

58. ශ්‍රී ලංකාවේ කුරුඳු පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේ කුමන ස්ථානයේ ද?

......................................................................................................................................................

59. ජාත්‍යන්තර අධිකරණ විනිශ්චය මණ්ඩලයේ (International Court of Justice) උපසභාපති වශයෙන් සේවය කළ ශ්‍රී ලාංකිකයා කවුද?

......................................................................................................................................................

60. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ, ශ්‍රී ලංකාවේ පිහිටි දියමත ලිස්සා යාමේ (surfing) මුහුදු ප්‍රදේශය කුමක් ද?

......................................................................................................................................................

61. ඔරාබි පාෂා යනු කවරෙක් ද?

......................................................................................................................................................

62. ශ්‍රී ලංකාවේ 'ගී ගයන මසුන්' සිටින්නේ යැයි ප්‍රසිද්ධ ස්ථානය කුමක් ද?

......................................................................................................................................................

63. යාපනේ නල්ලූර් ප්‍රදේශය ප්‍රසිද්ධ වීමට ප්‍රධාන හේතු දෙකක් ඇත. ඉන් **එක්** හේතුවක් ලියන්න.

......................................................................................................................................................



EXAMMOOD.LK
EXAMMOOD.LK

64. වර්ෂ 1981 දී ආරම්භ කරන ලද මූලික අධ්‍යයන ආයතනය (The Institute of Fundamental Studies) පිහිටුවා ඇත්තේ ශ්‍රී ලංකාවේ කුමන නගරයේ ද?

.............................................................................................................................................

65. වර්ෂ 1988 දෙසැම්බර් මස 17 වෙනිදා සම්මත වූ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වෙනි සංශෝධනය කුමක් ද?

.............................................................................................................................................

66. ශ්‍රී ලංකාවේ නවවෙනි පරිපාලන පළාත පිහිටුවන ලද්දේ වර්ෂ 1889 දී ය. ඒ පළාත කුමක් ද?

.............................................................................................................................................

67. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායක මණ්ඩලය හඳුන්වනු ලැබුවේ කුමන නමකින් ද?

.............................................................................................................................................

68. බ්‍රිතාන්‍යයින්ගේ ආක්‍රමණයට පෙරාතුව ශ්‍රී ලාංකිකයන් තුළ පැවති සහජීවනය හෙළි කරන බොහෝ අවස්ථා අතුරින් **එක්** අවස්ථාවක් දක්වන්න.

.............................................................................................................................................

69. තේසවලාමි නීතිය සංග්‍රහ කොට, එය නීතියක් වශයෙන් භාවිත කළ ප්‍රථම යුරෝපීය ආක්‍රමණිකයෝ කවරහු ද?

.............................................................................................................................................

70. ශ්‍රී ලංකාවට ආවේණික පැරණි ද්වන්ධ සටන් ක්‍රමය කුමක් ද?

.............................................................................................................................................

71. බ්‍රිතාන්‍යයන් විසින් ලන්දේසීන් පරදවා ඔවුන්ට අයත් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත්කර ගත්තේ කුමන වර්ෂයේ දී ද?

.............................................................................................................................................

72. සතුන් වෙනුවෙන් පවා නීතිය සාධාරණ ලෙස ඉටු කළ පැරණි ශ්‍රී ලංකාවේ විසූ රජතුමා කවුද?

.............................................................................................................................................

73. ලෝකයේ වාර්තාගත ප්‍රථම බුද්ධි පරීක්ෂණය වශයෙන් ඇතැම් ශ්‍රී ලාංකික ඉතිහාසඥයින් විසින් සලකනු ලබන්නේ කුමන ඓතිහාසික සිද්ධිය ද?

.............................................................................................................................................

74. වර්තමාන ඉන්දියාවේ පංචායත් පාලන ක්‍රමය මෙන්, පැරණි ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ ඉතා කුඩා පරිපාලන ඒකකය කුමක් ද?

.............................................................................................................................................

75. වර්තමාන ශ්‍රී ලංකාවේ සාහිත්‍යය, සංගීතය සහ නාට්‍ය කලා ආදිය සඳහා එක්තරා ආභාසයක් ලැබුණේ කුමන ඉන්දියානු ප්‍රාන්දයාගෙන් ද?

.............................................................................................................................................

76. ජාතික චරිතාංගයක් වශයෙන් වැඩසොඩභාවය (workaholism) ජීවන ශෛලිය කොටගත් වැසියන් ජීවත් වන ආසියානු රට කුමක් ද?

.............................................................................................................................................

EXAMMOOD.LK
EXAMMOOD.LK

77. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්බාධක පනවා ඇති රටක් නම් කරන්න.

.....................................................................................................................

78. කාබන් විමෝචනය අඩු කරමින් පිරිසිදු බලශක්ති (clean energy) කරා යන ආසියානු රටක් නම් කරන්න.

.....................................................................................................................

79. පසුගිය මාර්තු මාසයේ පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ දී ශ්‍රී ලංකාවට පක්ෂව ඡන්දය දුන් දකුණු ඇමරිකානු රට කුමක් ද?

.....................................................................................................................

80. පසුගිය දශකය ඇතුළත අයිස් කඳු දියවීම දෙගුණයකට වඩා වැඩිවී ඇති යුරෝපීය රටවල් දෙකින් **එකක්** නම් කරන්න.

.....................................................................................................................

81. ඉතා මෑතක සිට චීනය හා පිලිපීනය අතර හටගෙන ඇති ආරවුලට හේතුව කුමක් ද?

.....................................................................................................................

82. ඉන්දියාවේ ධවල විප්ලවය යනු කුමක් ද?

.....................................................................................................................

83. චීනයේ සහ ගිනිකොන ආසියාතික රටවල ඇතැම් දේශීය බෙහෙත් වර්ග සාදා ගැනීම සඳහා මෙම සතුන්ගේ අඟ භාවිතයට ගැනේ. ඒ සඳහා ඝාතනය කරනු ලබන සත්ත්ව වර්ගය නම් කරන්න.

.....................................................................................................................

84. ජාත්‍යන්තර දින රේඛාව වැටී ඇත්තේ කුමන දූපත් හරහා ද?

.....................................................................................................................

85. ලෝකයේ ගංගා **නැති** රටක් නම් කරන්න.

.....................................................................................................................

86. ඉතා මෑතක සිට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය වෙත නැඹුරුවෙමින් සිටින ආසියානු රට කුමක් ද?

.....................................................................................................................

87. 'Eurozone' රටවලට අයත් වන්නේ යුරෝපා සංගමයේ රටවල් 27 න් 17 ක් පමණි. Eurozone රටවල විශේෂත්වය කුමක් ද?

.....................................................................................................................

88. වර්ෂ 1986 දී යුක්‍රේනයේ සිදු වූ මහා න්‍යෂ්ටික බලාගාර පිපුරුම සිදු වූ ස්ථානය නම් කරන්න.

.....................................................................................................................

89. සෞඛ්‍ය පිළිබඳ පර්යේෂණවලට හා රටරටවල සංවර්ධනයට උදව් කරන ලෝකයේ විශාලතම පරාර්ථකාමී පෞද්ගලික සංවිධානය නම් කරන්න.

.....................................................................................................................

EXAMMOOD.LK

90. "මේ වනාහි මිනිසා තැබූ එක් කුඩා පියවරකි. එහෙත් එය මානව වර්ගයා තැබූ යෝධ පිම්මකි. (That's one small step for man, but a great leap for mankind)" නමැති ප්‍රකාශය කළේ වර්ෂ 1969 දී විශිෂ්ට වික්‍රමයක් කළ පුද්ගලයෙකි. ඔහු කවුද?

.............................................................................................................................................

91. අල්ලසට හා දූෂණයට විරුද්ධව හඬනගා 'ලෝක්පාල්' නමැති පනත ගෙන ඒමට ඉන්දියානු රජයට බල කළ සමාජ ක්‍රියාධරයා (social activist) නම් කරන්න.

.............................................................................................................................................

92. වර්ෂ 1967 දී පිහිටුවන ලද ASEAN නමැති කෙටි නමින් හඳුන්වනු ලබන සංවිධානයේ සම්පූර්ණ නම සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ ලියන්න.

.............................................................................................................................................

93. 'අරංගේත්‍රම්' යන්න හඳුන්වන්න.

.............................................................................................................................................

94. ඉස්ලාම් ධර්මයට විරුද්ධ අදහස් ස්වකීය නවකථාවලින් ඉදිරිපත් කිරීම නිසා ඉස්ලාම් භක්තිකයින්ගේ උදහසට ලක්වී ඇති නවකතාකරුවා කවුද?

.............................................................................................................................................

95. අඩි 35 000 කට වඩා වැඩි ගැඹුරු මුහුදු ස්ථානයක් වන මරියානා ආගාධයේ මෑතක දී කිමිදුණු චිත්‍රපට අධ්‍යක්ෂවරයා කවුද?

.............................................................................................................................................

96. ලබන ජූලි මස 27 වෙනි දින සිට ආරම්භ වන ලන්ඩන් ඔලිම්පික් ක්‍රීඩා තරගයට සහභාගි වන රටවල් ගණන **හෝ** එහි ක්‍රීඩා ඉසව් ගණන **හෝ** සඳහන් කරන්න.

රටවල් ගණන : ..............................          ක්‍රීඩා ඉසව් ගණන : ..............................

97. රෙදි සේදීමට යොදා ගන්නා සෝඩාවල අඩංගු රසායනික ද්‍රව්‍යය කුමක් ද?

.............................................................................................................................................

98. දුර මැනීමේ ක්‍රමයක් වශයෙන් තවමත් සැතපුම් ක්‍රමය අනුගමනය කරන රටක් නම් කරන්න.

.............................................................................................................................................

99. ඊ - අපද්‍රව්‍ය යනු මොනවා ද?

.............................................................................................................................................

100. I C T 4 Dev යනු කුමක් ද?

.............................................................................................................................................

***